කෑගල්ල ප්‍රාදේශීය සභාව - 2021
-------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

කෑගල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථීක තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොරොන්තොට පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2019 වර්ෂයේදී ලබාගත් ණය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලිය රු.5,379,322ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියට ගෙවිය යුතු පොළී මුදල වන රු.5,379,322ක මුදල ඉදිරියේදී ගිණුම්ගත කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත්කර තිබුණු රංවල හංදියේ පිහිටි පැරණි ගම්සභා ගොඩනැගිල්ලේ වටිනාකම රු.1,200,000ක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පැරණි ගම්සභා ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරීමට අතපසු වී තිබුණු බවත් , 2022 වර්ෂයට අදාල ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බවත් දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |

1.7 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | ----------------- | ------------------------ | ------------ |
| පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 01/2010 දරන චක්‍රලේඛය - 7.4 (iv) ඡේදය | 2020 සහ 2021 වර්ෂවලදී සභිකයින් 17 ක් සහ 16 ක් සඳහා චක්‍රලේඛයට පටහැනිව වෛද්‍ය හේතූන් නොවන හෝ පළාත් පාලනයට අදාල නොවන හේතූන් මත සභා රැස්වීම් සඳහා නොපැමිණි දින 65 ක් වෙනුවෙන් දිනකට රු. 15,000 බැගින් රු. 975,000ක සභික දීමනා ලේකම්ගේ නිර්දේශය හා සභාපතිගේ අනුමැතිය මත ගෙවා තිබුණි. | මන්ත්‍රීවරු දැනුවත් කර ඇති අතර, ඉදිරියට වෛද්‍ය වාර්තා නොමැතිව දීමනා නොගෙවන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිපල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,210,272ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,293,998ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ----------- |
| | වරිපනම් හා බදු<br>------------------- | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය අංශයේ වරිපනම් ඒකක 15 කින් හා පෞද්ගලික අංශයට අයත් වරිපනම් ඒකක 1776 කින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු. 2,184,193 ක් වූ අතර, ඒ තුල පැවති වසර 05 ට වැඩි රු. 261,635 ක ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන | කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝ කාලයක් රට වසා තිබුණු අතර, ආදායම් පරීක්ෂකවරුන්ට නිසිපරිදි ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරීමට හා දේපළ තහනම් කිරීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු කිරීමටද නොහැකි වූ බවත් ඉදිරියේදී මෙම කාර්යයන් නිසියාකාරව සිදුකර ආදායම් අයකිරීමේ ක්‍රියාවලිය විධිමත්ව ඉටු කිරීමටත් හිඟ මුදලින් වැඩි ප්‍රතිශතයක් අයකර | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගැනීමටත් කටයුතු කරන බව දන්වා තිබුණි. | |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ඒකක 380 කින් අයවිය යුතු අක්කර බදු ශේෂය රු. 256,308 ක් වූ අතර, ඉන් රු. 51,419 ක් සමාලෝචිත වර්ෂයට අදාල හිඟ ශේෂ වන අතර රු. 204,889 ක ශේෂය වසර 01 ට වැඩි හිඟ ශේෂ වේ. | ඉඩම් කොටස් කිරීම හේතුවෙන් අක්කර බදු අයකල යුතු භූමි ප්‍රමාණය අඩු වී ඇති අතර, හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කර ඇති බවත් සමීක්ෂණයන් සිදුකර එහි වාර්තා මත ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කලයුතුය. |